<u>**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු.**</u>

**01. හෙරොයින් සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - සීදූව පොලිස් ස්ථානය.**

2025.06.05 වන දින රාත්‍රී කාලයේ සීදූව පොලිස් වසමේ රාජපක්ෂපුර ප්‍රදේශයේදී සීදූව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් 03 ක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 300 ක්, හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 250 ක් සහ හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් තිදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 28, 34 සහ 45 වයස්වල පසුවන සීදූව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සීදූව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වැල්ලම්පිටිය පොලිස් ස්ථානය.**

2025.06.05 වන දින රාත්‍රී කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ නාගහමුල්ල ප්‍රදේශයේදී වැල්ලම්පිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 100 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 26 ක් වල වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවකි.**

වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පැළියගොඩ පොලිස් ස්ථානය.**

2025.06.05 වන දින රාත්‍රී කාලයේ පැලියගොඩ පොලිස් වසමේ සුදර්ශනාරාම මාවතේදී පැළියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 300 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 45 ක් වන පල්ලෙබැද්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පැළියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය.**

2025.06.05 වන දින සවස් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ කොළඹ 14 ප්‍රදේශයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 500 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 18 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වේයන්ගොඩ පොලිස් ස්ථානය.**

2025.06.05 වන දින රාත්‍රී කාලයේ වේයන්ගොඩ පොලිස් වසමේ බාදුරාගොඩ ප්‍රදේශයේ අලක් අසලදී වේයන්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා ලීටර් 1080 ක් (බැරල් 06) සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 33 ක් වන වේයන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වේයන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. විදේශ රටක නිෂ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගලහ පොලිස් ස්ථානය.

2025.06.05 වන දින රාත්‍රී කාලයේ ගලහ පොලිස් වසමේ දෙල්තොට පියසේනපුර මාගර්යේදී ගලහ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මාගර් බාධක රාජකාරියේ යෙදී සිටියදී **විදේශ රටක නිෂ්පාදිත බෝර 12 වගර්යේ ගිනි අවියක් සහ බෝර 12 ජීව පතොරම් 03 ක් කාර් රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු සමඟ කාර් රථය** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 38 සහ 59 වයස්වල පසුවන කොච්චිකඩේ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ගලහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - තංගල්ල පොලිස් වසම.

2025.06.05 වන දින සවස් කාලයේ තංගල්ල පොලිස් වසමේ නලගම වගේගොඩ මාගර්යේ දෙමට වෙල්යාය අසලදී ධාවනය වූ අත්ට්‍රැක්ටර් රථයක් පාලනය කර ගැනීමට නොහැකිව මාගර්යෙන් ඉවතට විසි වී අසල තිබූ ඇලකට පෙරලී අනතුරක් සිදුව ඇත. අනතුරින් අත්ට්‍රැක්ටර් රථයේ රියදුරු බරපතල තුවාල ලබා තංගල්ල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 35 ක් වූ ලුණුගම්වෙහෙර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය තංගල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර තංගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - කුලියාපිටිය පොලිස් වසම.

2025.06.05 වන දින සවස් කාලයේ කුලියාපිටිය පොලිස් වසමේ කුලියාපිටිය මාදම්පේ මාගර්යේ කනදුල්ල ප්‍රදේශයේදී කුලියාපිටිය දෙස සිට මාදම්පේ දෙසට ධාවනය වූ වෑන් රථයක් එම දිසාවටම ඉදිරියෙන් ධාවනය වූ යතුරුපැදියකට ඉස්සර කිරීමට යාමේදී වෑන් රථය යතුරු පැදියේ ගැටී යතුරුපැදිය ඉදිරියට ඇදී ගොස් ප්‍රති විරුද්ධ දිසාවෙන් පැමිණි බස් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු සහ පසුපැදිකාරිය බරපතල තුවාල ලබා කුලියාපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු යතුරුපැදිකරු මියගොස් ඇති අතර පසුපැදිකාරිය නේවාසිකව ප්‍රතිකාර ලබයි.

**මරණකරු වයස අවුරුදු 23 ක් වූ බත්තුළුඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කුලියාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් වෑන් රථ රියදුරු සහ බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර කුලියාපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**